**ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිඩන වාර්තාව 2022 ජුනි 8 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාර අග්‍රිම ශේෂය රු. 78,714,274,286 ක් වුවද, භාණ්ඩාගාර ශේෂ පිරික්සුම අනුව එය රු. 78,714,283,000 ක් විය. | භාණ්ඩාගාර අග්‍රිම ගිණුමෙහි අග්‍රිම නිකුත් කිරීම් සහ දෙපාර්තමේන්තුවේ අග්‍රිම ලැබීම් අතර රු. 8714 ක වෙනසක් නිරූපණය වූ අතර එය දෙපාර්තමේන්තු අග්‍රිම ගිණුමෙහි භාණ්ඩාගාර අග්‍රිම වැඩිපුර සටහන්වීමක් විය. | සියළු ගැලපීම් නිවැරදිව හදුනාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (ii)2021 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද රු. 116,134,657 ක මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස දක්වා තිබුණි. | නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

#### (ආ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | | |
|---|---|---|
| (i) පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ආකෘතියෙහි දක්වා තිබූ දෙසැම්බර් 31 දිනට නිල නිවාස වටිනාකම රු. 3,751,000 ක් හා සංචාරක බංගලා වටිනාකම රු. 17,900,000 ක් 2021 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී නිවාස නොවන කාර්යාල ගොඩනැගිලි වටිනාකම වන රු. 319,764,000 ක ශේෂයට එකතු කර දක්වා තිබුණි. | 2022 මැයි මස ගිණුම් සාරාංශය මගින් ගිණුම් සටහන් නිවැරදි කර වාර්තා කිරීමට කටයුතු කරමි. | වත්කම් වර්ගීකරණය නිවැරදිව සිදු කිරිමටත් නිවැරදිව වාර්තා කිරිමත් කළයුතු විම. |

| | | |
|---|---|---|
| (ii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 70,000 ක් වටිනා රූපවාහිනි යන්ත්‍රය සහ රු. 930,000 ක් වටිනා කැමරා සහ උපාංග යන වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුළත් කර නොතිබුණි. | 2509 වැය විෂය යටතේ මිලදී ගත් මෙම වත්කම් අතපසුවීමක් හේතුවෙන් ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීම සිදුවී නොමැත. | වත්කම් වර්ගීකරණය නිවැරදිව සිදු කිරිමටත් නිවැරදිව වාර්තා කිරිමටත් කළයුතු විම. |

**(ඇ) නොසැසඳුනු පාලන ගිණුම්**

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව තැන්පත් ගිණුම් 5 ක එකතුව රු. 2,841,119,289 ක් වූ අතර උපලේඛන අනුව එය රු.2,818,748,994 වූයෙන් රු. 22,370,295 ක වෙනසක් විය. | විගණනය සඳහා දිස්ත්‍රික් කාර්යාලයන්හි උපලේඛන ඉදිරිපත් කිරීමට නොහැකිවීමත්, ප්‍රධාන කාර්යාලයේ උපලේඛන පමණක් ඉදිරිපත් කිරීමත් හේතුවෙන් මෙම වෙනස නිරූපණය වී ඇත. | නිවැරදිව වාර්තා කිරිම කළයුතු විම. |

**1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවිම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-20-19 වියදම් ප්‍රතිපූරනය කිරිම සඳහා අරමුදල් ලැබීම් රු. 1,098,324 කට අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | නිරීක්ෂණයෙහි සඳහන් තැන්පතු කාණ්ඩය යටතේ ශේෂ වාර්තා කර ඇත්තේ දිස්ත්‍රික් කාර්යාල කිහිපයක් විසින් වන අතර විගණනය සිදුවන අවස්ථාවෙහි එම දිස්ත්‍රික්කයන්ට අදාල සවිස්තරාත්මක තොරතුරු ප්‍රධාන කාර්යාලය සතු නොවුණි. | අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු විම. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුනු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය මුදල් රෙගුලාසි 110 හා 104 ප්‍රකාරව යාවත් කාලීන කර නොතිබුණි. | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කිරීම නිවැරදිව සිදු කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි 110 හා 104 ප්‍රකාරව හානි පාඩු ලේඛනය යාවත් කාලීන කල යුතු වීම. |
| (ආ) | රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය ර.නි. ඇප ආඥා පනත 612 (4) වගන්තිය ප්‍රකාරව පවත්වා නොතිබුණි. | ඇප ලේඛනය පවත්වා ගෙන යාම ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු විම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | තොරතුරු යාවත්කාලීන කිරිම සඳහා පසුගිය කාලය තුළ දෙපාර්තමේන්තුවේ වාහන අළුත් වැඩියාවන් හා අපහරණය කිරීමේ තොරතුරු ඇතුළත් කළ යුතුව ඇති බැවින් එම තොරතුරු ලබා ගැනීමෙන් පසුව අදාළ තොරතුරු යාවත් කාලීන කරනු ඇත. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව ලේඛනය යාවත් කාලීන කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අංක 07 දරන විසර්ජන පනතේ 6 වැනි වගන්තිය අනුව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඒවා සම්පූර්ණයෙන්ම උපයෝජනය කරගත යුතු බව දක්වා තිබුණද 331-2-2-1-1501 සුභසාධන වැය විෂය සඳහා 2021 ජුලි 29 දින ලබාගත් පරිපූරක මුදල රු. 4,500,870,000 ක්ද මුල් ඇස්තමේන්තුගත මුදල වන රු. 53,000,000,000 ක්ද ඇතුළුව | 2021 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභ ගෙවීම සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදනය රු.බිලියන 53ක් විය. එම වර්ෂයෙහි පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් ද ඉලක්ක කර ගනිමින් සහනාධාර ප්‍රමාණය වැඩිකිරීම ඉලක්ක කර ඇස්තමේන්තු පිළියෙල කරන ලද නමුත් රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් එය ක්‍රියාත්මක | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ශුද්ධ එකතුව රු.57,500,870,000 කින් රු. 55,400,092,366 වියදම් වූ පසු රු.2,100,777,634 ක් ඉතිරි වී තිබුණි. | නොවීය. මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරියට එය සෘජුවම හේතු විය. | |
| (ආ) | 2020 අංක 7 දරන විසර්ජන පනතේ 5 (1) හා 5 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු මු.රෙ 66 හා 69 ප්‍රකාරව වීරමොං පරිපාටිය අනුගමනය කර ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද වර්ෂය අවසාන වන විට එම මුදල් වැයකර නොතිබූ අවස්ථා 5 කට අදාලව රු. 7,824,698 ක ඉතිරිවීම් තිබු අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ හේතු ද විගණනයේදී පිළිගත නොහැකි විය. | නිරීක්ෂණය හා පූර්ණ වශයෙන් එකගවන අතර කවර හෝ තත්වයක් තුළ යළි එවන් දෝෂ ඇති නොවන පරිදි කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වැය විෂයන් 29 ක එකතුව රු. 5,950,096,700 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂයේ වියදම රු.4,466,687,414 ක් වූ අතර රු. 1,483,429,286 ක් උපයෝජනය කිරිමකින් තොරව ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල වසා තැබීම ද , වියදම් පාලනය කිරීමට භාණ්ඩාගාරය විසින් ලබාදුන් උපදෙස් ද හේතුවෙන් 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කර සැලසුම් කරන ලද කාර්යයන් රැසක් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 9 කදී ලබාගත්, විවිධ සේවාවන් හා සැපයුම්වලට අදාළව ගෙවිය යුතු රු. 183,098 ක වටිනාකම බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. තවද විවිධ සේවාවන් වෙනුවෙන් වෙන්කරන ලද බැරකම් 4 කට අදාළව රු. 344,507 ක් අඩුවෙන් බැරකම්වල දක්වා තිබුණි. | 2021 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කරන ලද අවස්ථාව වන විට ද ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි මෙම වියදම් බැරකම් ලෙස සටහන්ව නොමැත. නමුත් බැදීම් ඇති කරගෙන පැවති පාර්ශවයන්ට ගෙවීම් කිරීම සිදු කළ යුතුව ඇති බැවින් ගෙවීම් කර ඇති අතර | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයට ඇතුළත් කර ඇත. | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ බැරකම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැරකම් අතර වැය විෂය දෙකකට අදාළව රු. 320,619 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කරන ලද අවස්ථාව වන විට ද ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මෙම වෙනස නිරූපණය වේ. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතු වීම. |
| (ඇ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ සියලුම බැරකම් ඊලඟ වර්ෂයට ගෙන නොයා එම මුදල් වර්ෂයේදීම ගෙවා නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවත්, එම උපදෙස්වලට පටහැනිව ඇති කරගන්නා බැරකම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී වැය විෂයයන් 8 ක ඉතිරි කිරීම් එකතුව රු. 99,432,128 ක් ඉක්මවා රු.182,849,545 ක බැරකම් ඇති කරගෙන තිබුණි. | 2021 වර්ෂය තුළ ආයතනයේ පාලනයෙන් බැහැරවූ සමාජ තත්වයන් තුළ ක්‍රියාත්මක කිරීමට සිදුවූ සුවිශේෂ වැඩසටහන් හේතුවෙන් අනිවාර්යයෙන් සිදු කළ යුතුව තිබූ කාර්යයන් වෙනුවෙන් බැඳීම් සඳහා එළඹීමට සිදුව තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතු වීම. |

**2.3 අත්තිකාරම් ගිණුම**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ----------------------------- | ---------------------- |
| **(අ)** | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/AA/LR/01/2022 දරන 2021 දෙසැම්බර් 31 දිනැති ලිපිය මඟින් අත්තිකාරම් ගිණුමේ සීමා සංශෝධනයට මුදල් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 අප්‍රේල් 08 විගණන දිනය වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | සීමා සංශෝධනය සඳහා කරන ලද ඉල්ලීම අනුමත කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. අනුමැතිය ලද පසු ඒ පිළිබඳ දන්වනු ලබන බවද දැනුම් දී ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** | ස්ථාන මාරුවීම්, මියයාම, වැඩ තහනම් කිරීම සහ සේවය හැරගිය සේවකයින් 147 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 05 ඉක්මවූ හිඟ හිටි ණය ශේෂය | මියගිය නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිත මෙතෙක් සකස් කර නොමැති බැවින් අයකර ගැනීමට නොහැකි වී ඇත. සේවය හැරගිය | ණය මුදල නිරවුල් කිරීම කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු. 2,188,931 ක් විය. මෙම ණය ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ශේෂය රු. 657,719 ක් ද වසර 4 ත් 5 ත් අතර හිග හිටි ශේෂය රු. 648,198 ක් ද වසර 3-4 අතර හිග හිටි ණය ශේෂය රු. 407,269 ක් ද වසර 1-3 අතර හිඟහිටි ශේෂය රු. 307,780 ක් වශයෙන් පැවතුණි. | නිලධාරීන් සියළු දෙනා වසර 10 යකට වඩා වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් බැවින් ඇප ඉදිරිපත් කර ද නොමැත. එබැවින් ඔවුන්ගේ ණය ශේෂ අයකර ගැනීම ගැටළු සහගතවී ඇත. වැඩතහනම් කරන ලද නිලධාරීන්ගේ විනය ක්‍රියාමාර්ග අවසන්ව නොමැති බැවින් අයකර ගැනීමට හැකියාව ලැබී නැත. | |
| (ඈ) | සේවයේ නියුතු නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු ආපදා හා ගංවතුර ණය ශේෂය රු. 672,348 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | 2021 වර්ෂයේ පටන් දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල යටතේ වැටුප් නොලබන සියළු සේවකයින්ට ආපදා ණය අත්තිකාරම් බී ගිණුම යටතේ නිකුත් කරනු ලැබේ. | ණය මුදල නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සමෘද්ධි අධිකාරිය පැවති කාලයේදි නිලධාරීන්ට ණය ලබා දෙනු ලැබූ සේවක ණය චක්‍රීය අරමුදල අඛණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමකින් තොරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරිම යටතේ 2020 වර්ෂයේදී නිලධාරීන් 302 දෙනෙකු සඳහා රු. 66,257,360 ක ආපදා ණය ලබා දී තිබුණි. මේ ආකාරයට සේවක ණය චක්‍රීය අරමුදලින් අඛණ්ඩව ලබා දෙනු ලැබුවද, ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 8 ක මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය වන විට චක්‍රීය අරමුදල මඟින් ණය ගෙවීම නතර කර තිබූ අතර සේවක ණය චක්‍රීය අරමුදලේ 2022 වර්ෂයේ මාර්තු මස බැංකු ප්‍රකාශනය අනුව රු. 94,216,546 ක වාසි සහගත ශේෂයක් ජංගම ගිණුමේ පැවතුණි. | සේවක ණය චක්‍රීය අරමුදලෙහි ගිණුම් පිළියෙල කරමින් පවතින අතර කඩිනමින් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ණය මුදල නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා පමණක් ලබාදෙන බැංකු මූලා අංශයේ විශේෂ සේවක ණය හා සමෘද්ධි බැංකු වලින් ලබාදෙනු ලබන සමෘද්ධි බැංකු විශේෂ ණය, ලබාදිමේදි වෙනත් සේවාවන් වලින් දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවි පැමිණි නිලධාරීන් සඳහා අවස්ථා 4 ක දි රු. 2,850,836 ක ණය ලබාදී තිබූ අතර එම ණය මුදල් දෙපාර්තමේන්තු සේවයෙන් ඉවත්ව යන අවස්ථාවලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුගත නොවන නිලධාරීන්ට ණය නිකුත් කිරීම් මේවනවිට නවතා ඇති අතර දෙපාර්තමේන්තුවෙන් බැහැරට ස්ථානමාරු ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ඔවුන්ගේ මාසික වැටුපෙන් විධිමත් පරිදි අවකරණය වන බව ද දන්වනු කැමැත්තෙමි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

**2.4 නීති, රිති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ----------------- | ---------- | ----------- | ----------- | --------- |
| | රු. | | | |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ<br><br>**(i)** මු.රෙ.135 හා 381 **(i)** | -- | පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූලා පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබු අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | පුහුණු මධ්‍යස්ථාන 03හි ජංගම ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් විමසු අවස්ථාවේදී මේවන විට පවත්වාගෙන යනු ලබන ගිණුම් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන ලෙසත් ,එම ගිණුමෙහි කටයුතු පවත්වා ගෙන යනු ලබන නිලධාරීන්ගේ තොරතුරු ලබා දෙන ලෙසත් වාචිකව උපදෙස් දෙන ලදි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** මු**.**රෙ.189 සහ 486 | 2,887,765 | 2021 දෙසැම්බර් මස බැංකු සැසඳීම් ප්‍රකාශනය අනුව මාස 11 ක සිට වසර 4 ක් දක්වා කාල පරාසයක් ඇතුළත තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 22 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(iii)** මු. රෙ. **396** | 164,300 | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6 ඉක්ම වූ චෙක්පත් 12 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(iv)** මු. රෙ. 756,757 සහ 1647 (ආ) | - | වාහන 146 ක් සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණයක් සිදුකිරිමට කටයුතු කර නොතිබුණි. | වාහන සමීක්ෂණ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් සිදු කර අවසන් අතර ප්‍රධාන කාර්යාලයේ වාහන සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවති. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | උපදෙස් පරිදි අනුමත තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ යෝජිත කාර්ය මණ්ඩලය ඇතුළත් සංවිධාන ව්‍යුහය සකස් කර 2020 ඔක්තෝබර් මාසයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර, සමස්ථ කාර්යමණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල ගිවිසුම් සකස්කර නොතිබුණි. | නිරීක්ෂණයේ සඳහන් පරිදි කාර්ය මණ්ඩල ගිවිසුම් සකස් කිරීමක් සිදුවී නොමැත. මේ සම්බන්ධව සොයා බලා කඩිනමින් පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) 2020 අගෝස්තු18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන චක්‍රලේඛයේ 15 ඡේදය | - | අරමුදල් ලෙස ස්ථාපිත කර ඇති දිවිනැගුම අරමුදල, සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල හා සේවක ණය චක්‍රීය අරමුදල පවත්වා ගෙනයාමේ අවශ්‍යතාවය සලකා බලා ඒවා ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් සම්බන්ධව දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පනත අනුව ව්‍යවස්ථාපිත අරමුදල් බවට පත්ව ඇත. මෙම අරමුදල් පවත්වාගෙන යාමට අවශ්‍ය නීති රෙගුලාසිමාලා සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ඉ) මුදල් අමාත්‍යාංශයේ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13.2 ඡේදය මාර්ගෝපදේශ අංක 3 | - | ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම පිළිබඳව සහ මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව අපහරණ ක්‍රියාවලිය සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති වාහන 29 ක් විය. | තාක්ෂණික කමිටු නිර්දේශ සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු සළකා බලා එහි ඵලදායීතාවය පිළිබඳ ලබාදෙන නිර්දේශ වලට අනුව එම වාහන අළුත් වැඩියාවට හෝ අපහරණය කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙසැම්බර් මස බැංකු සැසදුම් තුළ හදුනා නොගත් තැන්පතු රු. 25,971,852 ක් සහ උපලබ්ධි නොවූ තැන්පතු රු. 85,131,426 ක් ඇතුළත්ව පැවති අතර 2022 පෙබරවාරි මස වන විට රු. 4,477,765 ක ශේෂයක් මාස 2 සිට වසර 4 ක කාලයක් ගත වි ඇතත් උපලබ්ධිවී නොතිබුණි. | ශේෂ හදුනා ගෙන ඇති අතර එය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු විම. |

**2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි ප්‍රතිලාභින් වෙත ගෙවනු ලබන සහනාධාර මුදලින් යම් දායකත්වයක් ගෙන විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඇතිකර ගත් අරමුදල් සහ අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගනු ලබන සමෘද්ධි බැංකු සතු අරමුදල් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත 2004 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 6 කදී එකතුව රු. 47,653,794,136 ක් රජයේ විවිධ කටයුතු වෙනුවෙන් ලබාගෙන තිබූ අතර මේ වන තෙක් එම මුදල් අදාල සමෘද්ධි බැංකු හා අරමුදල් වෙත ආපසු ගෙවා නොතිබුණි. | නිරීක්ෂණයෙහි සඳහන් මුදල් මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූරණ කර දෙන ලෙස අඛණ්ඩව භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇතත් මෙතෙක් ප්‍රතිපූරණය කර දී නොමැත. භාණ්ඩාගාරය විසින් අදාල මුදල් ප්‍රතිපූරණය කිරීමෙන් අනතුරුව ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත පියවීමට කටයුතු කෙරේ. | අදාල මුදල් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**2.7 තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු මධ්‍යස්ථානවලින් රැස්කල ආදායම් රජයේ ආදායමට බැර කිරිමට කටයුතු නොකර එමඟින් වියදම් දැරීමෙන් අනතුරුව, ඉතිරි වු මුදල් රු. 2,380,951 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | පුහුණු මධ්‍යස්ථානයන්හි පරිපාලන වියදම් දැරීම සඳහා වෙන් කරනු ලබන මුදල් මෙලෙස තැන්පත් ගිණුමෙහි රදවා තබා ඇත. පුහුණු මධ්‍යස්ථාන නඩත්තු වියදම් රජයට වැය බරක් වීම වළක්වා ගැනීමේ අරමුණෙන් පුහුණු වැඩසටහන් මගින් උපයනු ලබන පරිපාලන වියදම රදවා තබා ගැණුන ද වසර දෙකක කාලයක් රදවා තබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආදායමට බැර කිරීමට මීට ඉහතදී ද කටයුතු කර ඇත. | රැස්කල ආදායම් රජයේ ආදායමට බැර කිරිමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය මගින් 2020/2021 වර්ෂවල කොවිඩ් සහනාධාර ලබාදීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවලට ලබා දී තිබූ මුදලින් ඉතිරි වී ආපසු එවා තිබූ රු. 231,162,935 ක් එම අංශයට නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කොවිඩ් සහනාධාර ලබාදීම සඳහා ප්‍රභවයන් කිහිපයකින් 2020 සහ 2021 වර්ෂයන් හි මූල්‍ය සම්පාදනය කර ගැනීම සිදුවිය. ඉතිරි මුදල් ආපසු එවීමේදී එම මූල්‍ය ප්‍රභවයන් අනුව වර්ගීකරණය කර ගිණුම්ගත කර ගැනීම පහසු කාර්යයක් නොවීය. එබැවින් සියළු ලැබීම් තැන්පත් ගිණුමෙහි රඳවා තබන ලදී. මේ වනවිට අභ්‍යන්තර විගණන අංශය මගින් සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙල කරමින් පවතින අතර එම වාර්තා ලැබීමෙන් අනතුරුව අදාල පරිදි මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉතිරි මුදල් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම**.** |
| (ඇ) | 2019 මැයි සිට 2021 ජුනි දක්වා කාලය තුළ නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු. 1,374,632 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 105 ක් මුදල් රෙගුලාසි 396 (අ) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු නොකර, පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | නිරවුල් කළ යුතු පාර්ශවයන් හදුනා ගෙන අදාල නිරවුල් කිරීම් සිදු කිරීම සඳහා තැන්පත් ගිණුමට මාරු කරන ලද මෙම ශේෂයන් හදුනා ගනිමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 සිට 2021 ඔක්තොම්බර් 27 දක්වා කාලය තුළ අවස්ථා 212 කදී දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට බැර වී තිබූ රු. 112,334,568 ක් මූල්‍ය ප්‍රභවය හදුනාගැනීමට නොහැකිව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කොවිඩ් සහනාධාර ලබාදීම සඳහා ප්‍රභවයන් කිහිපයකින් 2020 සහ 2021 වර්ෂයන් හි මූල්‍ය සම්පාදනය කර ගැනීම සිදුවිය. ඉතිරි මුදල් ආපසු එවීමේදී එම සමෘද්ධි බැංකු විසින් නිල ගිණුමට ප්‍රේෂණය කරන ලද මුදල් මෙලෙස තැන්පත් ගිණුමට බැර ඇත. මේවනවිට අභ්‍යන්තර විගණන අංශය මගින් සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙල කරමින් පවතින අතර එම වාර්තා ලැබීමෙන් අනතුරුව මුදල් බැරකරන ලද සමෘද්ධි බැංකු නිශ්චිත කර ගැනීමට පියවර ගනිමි. | මූල්‍ය ප්‍රභවය හදුනාගෙන නිරවුල් කිරීම කටයුතු කළයුතු වීම. |

| | | |
|---|---|---|
| (ඉ) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට විවිධ කාර්යයන් සඳහා ලබාදුන් මුදලින් ඉතිරි වී ආපසු එවා තිබූ රු. 452,688 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය මෙම නිරීක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කර ලද අතර ඒ පිළිබඳව සොයා බලා ආදායමට බැර කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | රජයේ ආදායමට බැර කිරිමට කටයුතු කළයුතු වීම. |
| (ඊ) තෙවන පාර්ශවයන් වෙත ගෙවීම් සඳහා තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුමේ දෙසැම්බර් 31 දිනට රු. 2,798,770,935 ක් වූ ශේෂය තුළ වර්ෂ 8 ක සිට වර්ෂ 10 ත් අතර කාලයක් පැරණි රු. 2,374,500,000 ක තැන්පතු ශේෂයක් විය. | එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර එකගතාවය මත සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා සමෘද්ධි අධිකාරියෙන් රු.මි. 3457.5 ක මුදලක් ලබාගෙන තිබිණ. අධිකාරිය සහ දෙපාර්තමේන්තු ඒකාබද්ධ කරන ලද අවස්ථාවෙහි අදාල ණය මුදලෙහි තවදුරටත් පියවිය යුතු ශේෂය 6000-0-0-13-0-123 තැන්පතු කාණ්ඩය යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙම ශේෂය නිරූපණය වේ. | මූල්‍ය ප්‍රභවය හදුනාගෙන නිරවුල් කිරීම කටයුතු කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 3.1 කාර්ය සාධනය
-----------------

#### 3.1.1 දැක්ම හා මෙහෙවර
-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ------------ |
| දුප්පත්කම නැති කිරිම මූලික අරමුණු කොට ගෙන පවුල ඒකකය පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති උපයෝගි කරගනිමින්, ආදායම් හා සමාජීය තත්ත්වයන් නගා සිටුවීමෙන් දුප්පත්කම පිටුදැකිමත්, තරුණ තරුණියන් රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට හා පරිපාලනයට සාජුවම දායක කරගැනීමටත් සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර තිබුණි. 2022 අප්‍රේල් මස වන විට මුළු සමෘද්ධි ප්‍රතිලාභින් සංඛ්‍යාව 1,760,865 ක් වූ අතර 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 09 ක කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 337, 645 ක සමෘද්ධි සහනාධාර වියදම් දරා තිබුණි. දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි වැඩසටහන තුළින් මේ වන විට ආර්ථික හා සාමාජීය වශයෙන් ඉහළ ජීවන තත්ත්වයක් ළගාකරගෙන ඇති ස්වශක්තියෙන් ඉදිරියට යා හැකි සවිබල ගැන්වෙන | | |

පවුල් හඳුනාගැනීම විධිමත්ව සිදු වී නොමැති බව සිදුකරනලද නියැදි පරීක්ෂාවේදි පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (අ) 1994 සිට 2011 දක්වා වසර 13 ක නියැදි පරීක්ෂාව අනුව සමෘද්ධි ප්‍රතිලාභ හිමි වූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 593,169 දෙනෙක් 2022 වර්ෂය වන විට වසර 10 ත් 27 ත් අතර කාලයක් තිස්සේ සහනාධාර ලබාගනිමින් පැවතීම. | සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට මේ දක්වා බලයට පත් වූ රජයන් විසින් අඩු ආදායම්ලාභී පවුල්වල ක්‍රය ශක්තිය ඉහළ දැමීමට අමතරව ඔවුන් සමාජ, ආර්ථික, අධ්‍යාපනික හා ආධ්‍යාත්මික වශයෙන් සවිබල ගැන්වීම තුළින් සහනාධාර වැඩසටහනින් ඉවත් කිරීම සඳහා වරින් වර ප්‍රතිපත්තිමය තීරණයන් ගන්නා ලදී. එහෙත් පැවති රජයන් වරින් වර වෙනස් වීම හේතුවෙන් එම තීරණ ක්‍රියාවට නැංවීම සිදු නොවීය. එබැවින් ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සහනාධාර ලබන පවුල් විශාල සංඛ්‍යාවක් දැකිය හැකිය. | මූලික අරමුණු අනුව සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ට අදාල මෙහෙයුම් කටයුතු සිදු කල යුතු විම. |
| (ආ) 1994 වර්ෂයේදී ආරම්භකරන ලද සමෘද්ධි වැඩසටහන තුළ ඉහළ ආදායම් මට්ටම කරා ළගාවී ඇති ප්‍රතිලාභින් ඉවත්කර නව ප්‍රතිලාභීන් ඇතුළත් කිරිම සඳහා කාලානුරූපිව ඔවුන් ලබන ආදායම් මට්ටම පසු විපරම් කිරිමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම. | 2017 වර්ෂයේදී දිවයිනම ආවරණය වන පරිදි සිදු කරනු ලැබූ පවුල් හඳුනා ගැනීමේ සමීක්ෂණය හරහා ලබා ගත් ප්‍රතිඵලය මත ආදායම් මට්ටම් ඉහළ ගොස් ඇති සහනාධාරලාභී පවුල් ඉවත් කිරීමට සැලසුම් කළද එය ක්‍රියාවට නැංවීමේදී ඇති වූ මහජන විරෝධතාවයන් හේතුවෙන් ඇති වූ තත්වය මත එම සමීක්ෂණ ප්‍රතිපල මත කටයුතු කිරීම රජය විසින් අත්හිටුවීමට තීරණය කරන ලදී. | ආදායම් මට්ටම පසු විපරම් කිරිමට නිසි ක්‍රමවේදයක් ඇති කළ යුතුය. |

### 3.1.2 කොවිඩ්- 19 වසංගත තත්ත්වයෙන් පීඩාවට පත් වූ ජනතාව සඳහා රු. 5,000 ක දීමනා ගෙවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අදියර දෙකකදී ප්‍රතිලාභීන් 4,542,865 ක් වෙනුවෙන් රු. 5,000 ක දීමනා ගෙවීමට එකතුව රු. මිලියන 22,302.85 ක වැය දැරීමට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) ගිණුම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව ඉහත සඳහන් සහනාධාර ගෙවීමට අවශ්‍ය මුදල් ලබාගැනීම සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල, සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල සහ සමෘද්ධි අරමුදල යන අරමුදල් සතුව මහජන බැංකුව හා ලංකා බැංකුවේ ඇති වටිනාකම රු. 11,352,242,292 ක ස්ථාවර තැන්පතු 91 ක් ඇපයට තබා රු. බිලියන 14 ක ණය ලබාගෙන තිබුණි. ණය පියවිම සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 7,164,971,000 ක් ලබා දී තිබුණි. ඒ අනුව තවදුරටත් ගෙවිය යුතු ණය මුදල රු. 6,835,029,000 ක් වූ අතර මෙහිදි අයකරනු ලබන පොළී වටිනාකම ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවන අවස්ථාවේදී ගණනය කිරීමට එකඟ වී තිබුණි. | මෙම මුදල් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා නිරන්තරයෙන් භාණ්ඩාගාරයට ඉල්ලීම් සිදු කරන අතර මාසික අක් මුදල් අයදුම් පත්‍රයෙහි ද මෙම ඉල්ලීම ඉදිරිපත් කරනු ලබයි. නමුත් අදාල මුදල් පියවීම සඳහා මෙතෙක් ප්‍රතිපාදන හෝ අක් මුදල් සැලසී නොමැත. | අරමුදල්වලට පාඩු නොවන ආකාරයට ණය මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ණය ලබාදීමේදී ගෙවීම් කාලය මාස 6 ක් ලබා දී තිබූ අතර නැවත මාස 3 ක් දීර්ඝ කර තිබුණද ණය ගෙවීමට කටයුතු නොකර 2022 ඔක්තෝබර් දක්වා නැවතත් කාලය දීර්ඝ කරගෙන තිබුණි. | භාණ්ඩාගාරය විසින් ණය මුදල පියවීම සඳහා ලබාදුන් කාලසීමාවන් තුළ එම ණය පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ අක් මුදල් නිදහස් නොකරන ලද බැවින් ණය පියවීමෙහි නීත්‍යානුකූලභාවය පවත්වා ගෙනයාම සඳහා මෙලෙස කාලය දීර්ඝ කර ගැනීම සිදු විය. | අරමුදල්වලට පාඩු නොවන ආකාරයට ණය මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |

### 3.1.3 සුවබොජුන්හල් ඉදිකිරිම

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේදී නව බොජුන්හල් 9 ක් ඉදිකිරිම සඳහා රු. 51,333,146 ක ප්‍රතිපාදන ලබා දී තිබු අතර ඉන් රු. 49,154,249 ක් වැයකර බොජුන් හල් 9 ක් ඉදිකර තිබුණි. 2021 වර්ෂයේදී ඉදි කරන ලද සුවබොජුන්හල් 2022 මාර්තු මස වන විටත් විවෘත කර නොතිබුණි. | වර්තමානයේ දිවයින තුල ඇති ඉන්ධන හා ගෑස් අර්බුදය මෙන්ම දේශිය සංචාරක කර්මාන්තය අකර්මන්‍ය විම නිසා දැනට ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන සමෘද්ධි සුව බොජුන්හල් බොහෝ බාධා යටතේ පවත්වාගෙන යනු ලබන අතර, ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට සුදානම් කර ඇති බොජුන්හල් විවෘත කිරීමට ද ප්‍රමාද වි ඇත. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු විම. |
| (ආ) 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ක සුව බොජුන්හල් ඉදිකිරිම වෙනුවෙන් රු. 33,269,239 ක් ලබා දී තිබුණද ඒවායේ වැඩ නිමකර විවෘත කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ දිවයින තුල ඇති ඉන්ධන හා ගෑස් අර්බුදය මෙන්ම දේශිය සංචාරක කර්මාන්තය අකර්මන්‍ය විම නිසා දැනට ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන සමෘද්ධි සුව බොජුන්හල් බොහෝ බාධා යටතේ පවත්වාගෙන යනු ලබන අතර, ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට සුදානම් කර ඇති බොජුන්හල් විවෘත කිරීමට ද ප්‍රමාද වි ඇත. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු විම. |

### 3.1.4 ප්‍රතිලාභී කළමනාකරන මොඩියුලය (CRM) ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමෘද්ධිලාභීන් මිලියන 1.76 ක් සඳහා සහනාධාර ගෙවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) හරහා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) 2021 ජනවාරි මස සිටම මොඩියුලය හරහා වාර්තා ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එවනු ලබන උපරිම වාර්තා පදනම් කරගෙන සහනාධාර ප්‍රතිපාදන සකස්කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 2 ක මාස දෙකක් වෙනුවෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව මොඩියුලය සහ උපරිම වාර්තා අතර ප්‍රතිලාභීන් 924 ක වෙනසක් පැවතුණි. | ප්‍රතිලාභී කළමනාකරණ දත්ත ඇතුලත් කිරීමේදී ඇති වූ තාක්ෂණික හා වෙනත් ප්‍රායෝගික ගැටළු හේතුවෙන් සැලසුම් කල පරිදි අදාළ කාර්යය නියමිත කාල සීමාව තුළදී ආරම්භ කිරීමට නොහැකි විය. | ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. |
| (ආ) 2022 මාර්තු 16 විගණිත දින මොඩියුලය හරහා ලබාගත් යාවත්කාලීන වූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 1,765,819 ක් වූ අතර එදිනට මුදල් අංශයෙන් ලබාගත් වාර්තා අනුව සමෘද්ධිලාභීන් 2409 ක ශුද්ධ වෙනසක් වාර්තා දෙක අතර නිරීක්ෂණය විය. මෙම පද්ධතිය මඟින් සහනාධාර නාම ලේඛනය වෙනස්වීමට කරනු ලබන ඉවත්වීම, නව එකතු කිරීම, නම හෝ වට්නාකම සංශෝධනය, පදිංචිය වෙනස්වීම දිනපතා යාවත්කාලීන කළ යුතු අතර සෑම මසකම පළමු රාජකාරි දින තුළ සහනාධාර මුදල් බැංකු වෙත ලබාදීම පිළිබඳ වාර්තා මොඩියුලය හරහා ලබා දිය යුතු වුවත් එසේ යාවත්කාලීනවීමක් සිදු නොවන බව 2020 සහ 2021 වර්ෂ තුල අතිරික්ත මුදල් පිළිවෙලින් රු. 37,579,986 ක් හා රු. 680,738,364 ක් ආපසු එවා තිබීමෙන් නිරීක්ෂණය විය. | CRM පරිගණක වැඩසටහන හරහා සහනාධාර සංශෝධන යාවත්කාලීන කිරීමට අදාළ නිලධාරින් දැනුවත් කර ඇති අතර, ඒ අනුව කටයුතු කරගෙන යාමේදී (සංශෝධන සිදු කිරීමේදී) ඇති වූ තාක්ෂණික හා වෙනත් ප්‍රායෝගික ගැටළු මේ සඳහා බලපා ඇත | ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) සැමට විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ දත්ත කළමනාකරණය මෙම මොඩියුලය හරහා සිදුකර තිබූ අතර මොඩියුලය තුළින් Dashboard අනුව සහ Count වාර්තා අනුව ලබාදෙන තොරතුරුවල නොගැලපීම් නිරීක්ෂණය විය. තවද විදුලි බල මණ්ඩලයේ තොරතුරු අනුව විදුලි සම්බන්ධතාවය ලබාදී ඇති නිවාස සංඛ්‍යාව 33,202 ක් ලෙසත් මොඩියුලය හරහා ලබාගත් තොරතුරු අනුව එය 12,658 ක් ලෙසත් දැක්වුණි. | අවස්ථා කිහිපයක දීම CRM මොඩියුලය යාවත්කාලීන කිරිම සඳහා අදාල නිලධාරින් දැනුවත් කිරිම් සිදු කර ඇත. | ප්‍රතිලාභි කළමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලිනව පවත්වා ගත යුතු වීම. |
| (ඇ) දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ව්‍යාපෘති පිළිබඳව තොරතුරු CRM මොඩියුලය හරහා සිදු කරනු ලබන අතර දිස්ත්‍රික් 2 ක් පිළිබඳව සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව ව්‍යාපෘති ආරම්භ කළ දිනය අනුමත කිරීම, ඉදිරි කටයුතු සිදුකිරිම, ප්‍රසම්පාදන කටයුතු සිදුකිරිම, නිමකිරිම පිළිබඳ තොරතුරු මොඩියුලයට ඇතුළත් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. | සියළු දිස්ත්‍රික්ක වෙත මේ වන විටත් 2022 මැයි 18 දිනට පෙර ව්‍යාපෘතිලාභි තොරතුරු යාවත්කාලීන කරන ලෙස දැනුවත් කරන ලදී. ඒ අනුව මෙම මස අවසන් වන විට දැනට ආරම්භකර ඇති ව්‍යාපෘතීන්හි තොරතුරු යාවත්කාලීන කර අවසන් කිරීමට හැකි වෙතැයි බලාපොරොත්තු වෙමි. | ප්‍රතිලාභි කළමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලිනව පවත්වා ගත යුතු වීම. |
| (ඉ) Covid -19 සහනාධාර ලබාදීම සම්බන්ධ තොරතුරු CRM මොඩියුලයට අන්තර්ගත කළ යුතු බව චක්‍රලේඛ මඟින් දැනුවත්කර තිබුණද එය නිසි පරිදි යාවත්කාලීන කර දි නොතිබුණි. | සියළු දිස්ත්‍රික්ක වෙත තොරතුරු යාවත්කාලීන කරන ලෙස දැනුවත් කරන ලදී. | ප්‍රතිලාභි කළමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලිනව පවත්වා ගත යුතු වීම. |

**3.1.5** දිවිනැගුම ප්‍රජාමූල බැංකු

-----------------------------

| | | |
|---|---|---|
| 2013 අංක 01 දරන දිවි නැගුම පනතේ 26 ඡේදයට අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල පරමාර්ථ ලෙස දිවිනැගුම ප්‍රතිලාභින්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම, ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම දක්වා තිබුණි. සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වංචා 135 කට අදාලව රු. 115,723,619 ක් සම්බන්ධයෙන් 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබූ අතර වාර්ෂිකව වාර්තාවී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා වල ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු වී තිබියදීත් මේ සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණය විසින් අවධානය යොමුකොට ඒවා වලක්වා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. බැංකු මුදල් අයථා පරිහරණය හේතුවෙන් දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා සඳහා යෙදවීමට ඇති මුදල් | ප්‍රධාන වශයෙන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල මූල්‍ය වංචාව වීමට හේතුව වශයෙන් අප හඳුනාගනු ලැබුවේ එම බැංකු වල අදාල නිළධාරීන් ගිණුම් කටයුතු සාමාන්‍ය ක්‍රමවේදයට සිදු කිරීමයි. ( මැනුවල් ) එබැවින් මේ වන විට සියළු සමෘද්ධි බැංකු හා බැංකු සමිති පරිගණක ක්‍රියාවලියට යටත් කිරිම සිදු කරමින් පවතී. එම කාර්ය තුලින් අප බලාපොරොත්තු වනුයේ ගනුදෙනු | සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ට අදාල මෙහෙයුම් කටයුතු සිදුකිරිමේදි නිසි අභ්‍යන්තර පාලනයක් ඇති කරගෙන කටයුතු කල යුතු වීම. |

| | |
|---|---|
| ඒ සඳහා යෙදවිය නොහැකි වි තිබුණි. අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය විසින් සිදුකර ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා වාර්තා විම් ප්‍රමාණාත්මක අගයක් ගන්නා බැවින් දිවිනැගුම පනත අනුව ඉටුකිරිමට බලාපොරොත්තු වන අරමුණු ඉටුකර ගැනිම සඳහා ඔවුන්ගෙන් ඉටුවිය යුතු රාජකාරි නිසි පරිදි ඉටු වී ඇද්ද යන්න විගණනයේදී ප්‍රශ්න ගත විය. | කරුවන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරිමත් එමෙන්ම අතින් සිදු කිරිමේදී සිතාමතා සිදු කරන වැරදි හා මූල්‍ය වංචා අවම කරගැනීමත් වේ. |

## 3.2 ආර්ථිකමය නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------- | ------------- |
| (අ) | සමෘද්ධි එෆ්එම් අන්තර්ජාල රේඩියෝව සඳහා විකාශන මධ්‍යස්ථානයේ උපකරණ සහ පාලන මැදිරියේ වියදම් වෙනුවෙන් රු. 1,127,000 ක් ද නිලධාරීන් පුහුණු කිරිම හා අවශ්‍ය තාක්ෂණික සහාය වෙනුවෙන් රු. 1,200,000 ක් ද ගෙවා තිබුණු අතර මේ වන විට ගිවිසුම්ගත කාලය අවසන්වීමෙන් එම වැඩසටහන ක්‍රියාත්මක කිරිම නතර වී තිබුණි. සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව ඇතිකිරිමේ මූලික අරමුණ වූයේ දූගීබව අවම කිරීමේ සංවර්ධන කාර්යයන්ට හා අඩු ආදායම්ලාභි ජන කොටස්වල උත්සාහයන්ට උරදෙන සන්නිවේදන රටාවක් ගොඩනගමින් සමෘද්ධි ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින් එහි ඉලක්ක වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාව අතරට සන්නිවේදනය කිරිම වුවද, එසේ සිදුකිරිමට අන්තර්ජාල පහසුකම් නොමැති, ස්මාර්ට් ජංගම දූරකථන නොමැති සහ අනෙකුත් අවම පහසුකම් නොමැති සමෘද්ධිලාභි, අඩු ආදායම්ලාභින්ට මෙම FM අන්තර්ජාල ගුවන් විදුලි සේවයෙන් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමේ හැකියාවක් පවතිද යන්න ප්‍රශ්න සහගත විය. | සමෘද්ධි FM රේඩියෝව ආරම්භ කර පළමු වසර තුළ එකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබුණි. අන්තර්ජාල රේඩියෝවක් ලෙස මෘදුකාංගයක් ජංගම දූරකථන හරහා ලබා දෙමින් මෙම අරමුණට ලඟාවීමට හැකිවේයැයි අපේක්ෂා කළේ ලංකාවේ ඒක පුද්ගල ජංගම දූරකථන භාවිතය සියයට 140 ක් වැනි ඉහල අගයක් ගන්නා බැවිනි. කෙසේ වෙතත් මෙවැනි තාක්ෂණික කාරණාවක අරමුණු එක වර්ෂයක් තුළින් සියයට 100 සාධනය කර ගැනීම අසීරු වන බැවින් මෙහි අරමුණු සාධනයේ ප්‍රශස්ත බව තීරණය කිරීමට ඊට වඩා කාලයක් අවශ්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | මූලික අරමුණු හා ඉලක්ක වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාව අතරට සන්නිවේදනය කිරිමට සුදුසු වැඩ පිළිවෙලක් සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | 2020 වර්ෂයේදී “e” පුවත්පත එළිදැක්වීම සඳහා වසර 3 ක කාලයක් සඳහා සේවා ලබා ගැනීමේ පදනමින් මෘදුකාංග මිලදී ගැනීම, “e” පුවත්පත් ප්‍රකාශයට පත්කිරීම් සහ මූලික පිටු සැකසීම වෙනුවෙන් රු. 9,403,900 ක් ගෙවීමට පෞද්ගලික ආයතනයක් සමඟ එකග වී තිබුණි. 2022 අප්‍රේල් මාසය වන විට අදාළ පෞද්ගලික ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව “e” පුවත්පත බාගත කරගත් සංඛ්‍යාව 15279 ක් හෙවත් මුළු සමෘද්ධිලාභීන්ගෙන් සියයට 0.86 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මේ වෙනුවෙන් දරන ලද වියදම රු.5,358,400 ක් විය. | e පුවත්පත එක් වරක් බාගත කරගත් පසු එය පරිගණක, ජංගම දූරකථනය, ටැබ් යන්ත්‍රය පරිශීලනය කරන ඕනෑම සංඛ්‍යාවකට කියවීමට හැකිවේ. ඒ අනුව බාගත කරගත් සංඛ්‍යාව තුළින් පරිශීලකයන් සංඛ්‍යාව තීරණය කළ නොහැකි වේ . තවද **e** පුවත්පත ආරම්භ කර වසරක් පමණ කාලයක් ගතවී ඇති අතර එය තවමත් ප්‍රාථමික මට්ටමේ පවතින බැවින් පරිශීලකයන් වර්ධනය කර ගැනීමට එය ප්‍රමාණවත් කාලයක් නොවන බව පෙනී යයි. | මූලික අරමුණු හා ඉලක්ක වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාව අතරට සන්නිවේදනය කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් සැකසිය යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්වීමේ වැඩසටහනට අදාල සැලැස්ම සකස් කිරීම සහ සමෘද්ධි ප්‍රතිලාභීන් 1,777,086 ක් කාණ්ඩගත කිරීමේ සමීක්ෂණය සඳහා රු. මිලියන 10.83 ක ප්‍රතිපාදනවලින් පවුල් 714,900 ක් සමීක්ෂණය වෙනුවෙන් අවශ්‍ය පවුල් කාණ්ඩ ගත කිරීමට අවශ්‍ය පෝරම මුද්‍රණය කර ගැනීම සඳහා රු.මිලියන 10.03 ක් වැයකර තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 40 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 93 ක් විය. | මෙම ප්‍රතිපාදන වැය දරන ලද්දේ අදාල පවුල් කාණ්ඩ ගත කිරීමට අවශ්‍ය පවුල් සමීක්ෂණය වෙනුවෙන් අවශ්‍ය පෝරම මුද්‍රණය කර ගැනීම වෙනුවෙනි. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක් විසින්ම පළමුවෙන්ම කලයුතු වූ අදාල පෝරම මුද්‍රණය කර ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 93% ක් වී ඇත. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | සවිබලගැන්විමේ වැඩසටහනට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනිම හා දැනුවත් කිරිමේ වැඩසටහන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 6.23 ක් ලබාදී තිබුණද දෙසැම්බර් 31 දිනට එහි මුල්‍ය ප්‍රගතිය රු. මිලියන 4.81 ක් හෙවත් සියයට 77 ක් විය. මෙම මුදලින් සියයට 91 ක් නිලධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීමට වැයකර තිබූ අතර පොළොන්නරුව හා මන්නාරම යන දිස්ත්‍රික්කවල පමණක් විවිධ ව්‍යාපෘති 9 ක් සඳහා රු. 414,883 ක් වැයකර අදාළ පුහුණුවිම් ලබා දී තිබුණි. | අදාල චක්‍රලේඛය පරිදි සියළුම දිස්ත්‍රික්කයන් වෙතින් ක්‍රියාත්මක ව්‍යාපෘති වලට අදාලව තාක්ෂණික පුහුණු වැඩමුළු වෙනුවෙන් ද ප්‍රතිපාදන ලබා ගැනිමේ හැකියාව පිළිබඳව උපදෙස් ලබා දී තිබු බැවින් පොළොන්නරුව හා මන්නාරම යන දිස්ත්‍රික්ක දෙක මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරන ලදී. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |
| **(ඇ)** | බලංගොඩ පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත පොහොර අංගනය ඉදිකිරිම සඳහා රු. 530,000 ක ප්‍රතිපාදන ලබා දී ඇතත් දෙසැම්බර් 31 දින වන විටත් එය ආරම්භකර නොතිබුණි. | අංගනය ඉදිකිරිම සඳහා අවශ්‍ය දැව, පුහුණු මධ්‍යස්ථාන භූමියෙන් සපයා ගැනිමට සැලසුම් කර තිබුණි. එසේ වුවද මධ්‍යස්ථාන භූමියේ ඇති දැව කපා වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීම නෛතික නොවන බව දන්වා ඊට අදාල අනුමැතිය බලංගොඩ ප්‍රාදේශිය ලේකම් විසින් ලබා දි නොමැති අතර දැව සපයා ගැනිම සම්බන්ධයෙන් වු ගැටළුව මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |
| **(ඈ)** | සමෘද්ධි පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්විමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරිම සඳහා කාර්යාල 1736 ක බැනර් ප්‍රදර්ශනය කිරිම වෙනුවෙන් විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් රු. 3,364,505 ක් වැය කර තිබුණි. | වැඩසටහනේ සමාරම්භක වැඩසටහන සම්බන්ධයෙන් බැංකු හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් බැනර් ප්‍රදර්ශනය කරමින් ප්‍රජාව දැනුවත් කිරිමට කටයුතු කරන ලදී. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

3.4 **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජාමූල සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 331 ක සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන 30,842 ක යටිතල පහසුකම් සැපයීම සඳහා වු රු. 19,000,000 ක ප්‍රතිපාදිත මුදලින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන 2742 කට කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු. 13,710,000 ක් වියදම් කර තිබුණි. | සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන සඳහා කාර්යාල උපකරණ සපයා ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීමේදී හා මුදල් ප්‍රේෂණය කිරීමේදී දිස්ත්‍රික්ක කිහිපයක කොවිඩ් වසංගත හේතු කොට ගෙන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් පරිපාලනමය ගැටළු මත මුදල් ප්‍රේෂණය කිරීමට හෝ ප්‍රතිපාදන ලබාදීමට ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මෙම තත්වය ඇති වූ බව සඳහන් කරමි. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

**3.5. ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 3 හා 4 ඡේදවල දැක්වෙන පරිදි හා 2021 දෙසැම්බර් 23 දිනැති 7/2020 දරන අයවැය චක්‍රලේඛය අනුව ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු වුවද එසේ නොමැතිව සුවබොජුන්හල් ඉදිකිරිම, අළුත්වැඩියාව, උපකරණ මිලදී ගැනිම් සහ බැනර් පුවරු සෑදීම ආදිය සඳහා 2021 දෙසැම්බර් මාසයේ දී රු. 10,642,564 ක් වැය කර තිබුණි. | ඒ ඒ දිස්ත්‍රික්ක මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම අනුමත කාර්යයන් සඳහා වියදම් දැරිම සිදුකරනු ලැබේ. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙළ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. 7,371,546 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | මෙම වර්ෂයේ කාර්යාලීය උපකරණ මිළදී ගැනිම පිණිස 2102 වැය විෂය යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවූ හෙයින් හදිසි හා අත්‍යාවශ්‍ය කාර්යන් සඳහා කාර්යාලීය උපකරණ මිළදී ගැනීමට වැය ශීර්ෂ අංක 2509 හි ප්‍රතිපාදන යොදවා මිළදී ගෙන ඇති අතර එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොමැති අතර පසුවට එම දෝශයන් මඟහැර කටයුතු කිරිමට සටහන් කරගන්නා ලදී. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

### 3.6. රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු සහ රජයේ ගිණුමට අදාළව වගකීම් පැවරී ඇති නිලධාරීන් ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබීම් කර නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු ආරම්භ කර ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |

**3.7 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමෘද්ධි දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනයේ යතුරු පැදි 14 ක් පවතින අතර මෙම යතුරු පැදි දෙපාර්තමේන්තුවේ වත්කම් වශයෙන් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කරුණ පිළිගන්නා අතර, මෙම යතුරුපැදි 14 දෙපාර්තමේන්තුව නමින් පවරා ගැනීමට අදාළ ආකෘතිපත්‍ර සම්පූර්ණ කර මෙම යතුරුපැදිවල මුල් අයිතිය පැවති ආයතනය මේ වන විටත් අහෝසි වී ඇති බැවින් එම අයදුම්පත් කොම්ප්ට්‍රෝලර්ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) සමෘද්ධි දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 146 කින් වාහන 33 ක් කාර්මික දෝෂ වලට ලක්ව දීර්ඝ කාලයක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ හා ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත රථගාලේ අනාරක්ෂිතව ගාල් කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉන් වාහන 14 ක් අළුත්වැඩියා කර ධාවනය කිරීමට සුදුසු තත්ත්වයේ පවතින බව 2020 ඔක්තෝබර් මස හා 2021 ජුලි මස කාර්මික නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරන ලද වාර්තාවලින් නිරීක්ෂණය විය. මෙම වාහන අළුත්වැඩියා කිරීමට විගණිත දිනය වූ 2022 අප්‍රේල් 24 දින දක්වා කළමනාකරණය විසින් ක්‍රියා කර නොතිබුණි. මේ ආකාරයට අනාරක්ෂිත පවතින මෙම වාහන කඩිනමින් අළුත්වැඩියා නොකිරීමෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත් වීම, අළුත්වැඩියා වියදම් අධිකවීම, වාහනවල අමතර කොටස් අස්ථානගතවීම සිදුවිය හැකි බවත් එය වළක්වා ගැනීම කළමනාකරණයේ වගකීම බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | කාර්මික දෝෂවලට ලක්ව ඇති වාහන සියල්ල එකවර අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම පිළිබඳ තාක්ෂණික කමිටුවක් මඟින් ලබාදෙන නිර්දේශ මත පිහිටුවා කටයුතු කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා යම් ප්‍රමාදයන් සිදුවන බව සඳහන් කරමි. දැනටමත් එවැනි වාහන 04 ක් අළුත්වැඩියා කිරීමට අදාළ මූලික කටයුතු සිදු කර ඇත. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් අරපිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව අරමුදල් යෙදවිය යුතු වීම. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 ක් හා සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රමාද කාලය මාස 1 ක සිට මාස 29 ක් ඉක්ම වූ කාල පරාසයක් වී තිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 192,875,829 ක් විය. | පසුගිය වසර තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ දී ප්‍රමාදයන් සිදුවූ බව පිළි ගනිමි. මේවනවිට සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇති අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය පරීක්ෂා කර පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර විගණන විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වීම. |

## 3.9 කළමනාකරන දූර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 මැයි 31 දිනැති අංක DSD/HO/6/EP/2/55/10 දරන දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත යොමුකරන ලද අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව බොජුන්හල් ඉදිකිරීමේදී අදාළ ඉඩම දෙපාර්තමේන්තුවට පවරාගැනීමට හැකි ඉඩමක් විය යුතු බවත් අවම වශයෙන් පර්චස් 20 ක ඉඩමක් විය යුතු බවත් දක්වා තිබුණද 2016 සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ සුවබොජුන්හල් 31 ඉදිකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. 171,370,352 ක වියදම් දරා තිබුණද එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පවරා ගැනිමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස දන්වමින් අංක DSD/HO/6/EP/6/SS/assign. හා 2022 අප්‍රේල් 30 දිනැති ලිපිය මගින් සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) 2016 සිට 2021 වර්ෂය දක්වා කාලය තුලදී සුවබොජුන්හල් ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම හා අළුත්වැඩියාවන් සඳහා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා රු. 171,370,352 ක් වියදම් දරා තිබුණද, එයින් කිසිදු ආදායමක් ලබා ගැනීමට ක්‍රමෝපායන් යොදා නොමැති බව නිරීක්ෂණය විය. | බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන වලින් ලැබෙන ආදායම ප්‍රාදේශීය සංවිධානය නමින් ප්‍රජාමූල බැංකු සමිතියේ ඇති ගිණුමට බැර කළ යුතු බවට උපදෙස් නිකුත් කර ඇත. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම් සකස් කර නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 3.10 හානි පාඩු පිළිබඳ පරීක්ෂාව

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016,2017 සහ 2018 වර්ෂවලදි සිදු වූ වාහන අනතුරු 5 කට අදාළව, අනතුරු සිදු වී වසර 2 ½ සිට වසර 5 දක්වා කාලයක් ගතවීමෙන් පසු මු.රෙ 104(3), 104 (4) ප්‍රකාරව කටයුතු සිදුකර තිබුණි. | පරීක්ෂණ සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු විම. |
| (ආ) වාහන 6 ක් සම්බන්ධයෙන් සිදු වූ අනතුරු පිළිබඳව හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. | වාහන 06 ක් සම්බන්ධයෙන් හානිපාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර, ඒ සඳහා වන පරීක්ෂණ තීරණය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | නිසි පරිදි ලේඛනවළට ඇතුලත් කලයුතු විම. |
| (ඇ) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව අනතුරු සිදුවීමෙන් පසු ප්‍රාරම්භක වාර්තාව හා මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 7 ක් සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කර නොමැති බව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. | පසුගිය වර්ෂවල සිදු වී ඇති වාහන අනතරු සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවන් ලබා ගැනීමට කමිටු පත් කර ඉදිරි කටයුතු කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු විම. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 මැයි 05 දින අනතුරට ලක්වූ වාහනය සම්බන්ධයෙන් 2016 අගෝස්තු 10 දිනැති අධිකරණ නඩු තීන්දුව මඟින් රියදුරු වරදකරු බව තීරණය කර තිබුණි. මෙම රථය අළුත්වැඩියාව සඳහා රක්ෂණ වන්දි වශයෙන් ලැබු රු. 564,840 ක් වැයකර තිබුණි. හානියට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට කළමනාකරණය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි. | වාහන අනතුරට අදාළව සිදු කළ මු.රේ. පරීක්ෂණයට අදාළව අධිකරණය විසින් රියදුරු වරදකරු කර ඇති බැවින් රථය අළුත් වැඩියාව සඳහා වැය කල රක්ෂණ වන්දි මුදල වන රු. 564,840 ක මුදල අයකර ගැනීම සම්බන්ධව අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරනු ඇත. | හානියට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

3.11 **අවිධිමත් ගනුදෙනු**

**----------------------**

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

| **විගණන නිරික්ෂණය**<br>------------------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>------------- | **නිර්දේශය**<br>------------------ |
|---|---|---|
| 2019 /41/04 දරන ජාතික සභා තීරණය අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනතේ 4 (3)(2) වගන්තිය අනුව සහතිකයක් නිකුත් කිරීමේදී හා වාර්ෂිකව අළුත් කිරීමේදී අයකරන ගාස්තු සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලට බැර කිරිම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව නව සහතික සඳහා රු. 500 ක් ද අළුත් කිරීම සඳහා රු. 300 ක් ද වශයෙන් අයකරන ලද රු. 34,157,800 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ පැවතුණි. 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත අනුව මැයි 31 දිනට යෙදෙන ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනයට සමගාමීව ක්‍රියාත්මක කරන ලද කොඩි හා ස්ටිකර් අලෙවි කිරිම මඟින් ඉපයූ ආදායම රු. 46,822,495 ක් මෙම අරමුදලට බැර කර තිබුණි. මෙම සමෘද්ධි සමාජ සංවර්ධන පදනම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන එහි කටයුතු විධිමත් කර ව්‍යවස්ථාපිත තත්ත්වයක් ඇතිකර ගැනිමට කටයුතු නොකර මුදල් රැස්කිරිමට හා රු. 87,500,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි. | 2017 අංක 02 දරණ පනතින් සංශෝධනය වූ 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය යටතේ සමෘද්ධි අධිකාරිය යටතේ පවත්වාගෙන ආ ප්‍රතිලාභීන්ගේ සමාජ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වූ "සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන පදනම" පවත්වාගෙන යාම සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. | අරමුදල් පාර්ලිමේන්තු පනත් මඟින් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4. යහපාලනය**

**4. 1 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටුව මඟින් විගණකාධිපති වාර්තා නිසි පරිදි සමාලෝචනය කර ඌණතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිවැරදි පියවර ගෙන නොමැති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු වී නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවලදී විගණකාධිපති විසින් යොමුකර ඇති විගණකාධිපති වාර්තා සම්බන්ධව සමාලෝචනය කරන අතර ඒ සම්බන්ධව මේ වනවිට නිරන්තරයෙන් පසුවිපරම් කිරීමට කටයුතු කරනු ඇත. | විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

**5 මානව සම්පත් කළමනාකරණය**

2021 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

| වර්ගීකරණය | අනුමත | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්ත |
| --- | --- | --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ | 106 | 66 | 40 | - |
| තෘතීය | 2,501 | 2,388 | 259 | 146 |
| ද්විතීය | 24,952 | 21,757 | 3,942 | 747 |
| ප්‍රාථමික | 516 | 434 | 90 | 8 |
| | 28,075 | 24,645 | 4,331 | 901 |

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දින වන විට අනුමත අධ්‍යක්ෂ තනතුරු 11 ක් , අනුමත ගණකාධිකාරි තනතුරු 20 ක් සහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ තනතුරු 6 ක් ද පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු තනතුරු සඳහා රාජකාරි ඉටුකිරිම, වැඩබැලීම සහ රාජකාරි | දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ දීපව්‍යාප්ත සේවාවල තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර එවන මෙන් රාජ්‍ය පරිපාලන | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගැනිමට කටයුතු කලයුතු විම. |

| | | | |
|---|---|---|---|
| | ආවරණය කිරීම් වශයෙන් පත්කිරීම් සිදුකිරිමට දෙපාර්තමේන්තුව විසින් ආරම්භයේ සිටම කටයුතු කර තිබුණි. තවද දෙපාර්තමේන්තුවේ ද්විතික, තෘතීක හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 4,291 ක් පුරප්පාඩුව පැවතුණ අතර අනුමත නොවූ සංවර්ධන නිලධාරී තනතුරු 746 ක් තත්‍ය කාර්ය මණ්ඩලයට අයත් විය. | අමාත්‍යාංශයට අවස්ථා කිහිපයකදී ලිපි යොමු කර ඇත. එසේම ද්විතීය, තෘතීය, ප්‍රාථමික මට්ටමේ පවත්නා පුරප්පාඩු පිරවීමට භාණ්ඩාගාර චක්‍රලේඛ මඟින් මේ වන විට නතරකර ඇත. එසේම අදියර තුනක් යටතේ උපාධිධාරින් 2403 ක සංඛ්‍යාවක් ස්ථිර පදනමින් මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙතෙක් අනුමතිය ලබා දී නොමැත. | |
| (ආ) | නියැදි විගණන පරීක්ෂාව අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්යාල, බැංකු හා බැංකු සමිති, කාර්යාල වල සිටිය යුතු සමෘද්ධි කළමනකාරුවන් සංඛ්‍යාව 54 ක් වුවත් 2021 ජුනි 30 දිනට තත්‍ය සංඛ්‍යාව 27 ක් විය. සමෘද්ධි කළමනාකරුවන් 9 දෙනෙකු විසින් වසර 5 කට වැඩි කාලයක සිට ස්ථිර සේවා ස්ථානයට අමතරව පුරප්පාඩු වූ ස්ථානවල වැඩ බැලිම සිදු කරමින් පැවතුණි. තවද, සමෘද්ධි සංවර්ධන නිලධාරින් 476 ක් අනුමත තර තිබුණද තත්‍ය සේවක සංඛ්‍යාව 410 ක් විය. | ඉදිරියේ බඳවාගැනීමේ දී මේ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරිමට කටයුතු කළයුතු විම. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරිම සහ ඉටුකිරිම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයකු ස්ථිරව පත්කල යුතු අතර මෙම තනතුර සඳහා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 8 ක කාලයක් තුළ අධ්‍යක්ෂ ජනරාල්වරු 11 දෙනෙකු පත්කර තිබූ අතර එම පත්වීම් බොහොමයක්ම කොන්ත්‍රාත් පදනම මත සිදුකර තිබීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අයහපත් ලෙස බලපාන බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව විෂයභාර ගරු අමාත්‍යවරු කිහිප අවස්ථාවකදී වෙනස්වීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරින් විටින් විට 11 දෙනෙකු පමණ පත්කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරිමට කටයුතු කළයුතු විම. |
| (ඈ) | විශ්‍රාම වැටුප් හිමිකම් රහිත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හා සේවක අර්ථ සාධක අරමුදලට අඛණ්ඩ දායකත්වයක් දරමින් දෙපාර්තමේන්තු සේවයට එක්විමට කැමැත්ත පලකල නිලධාරීන් 870 දෙනෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර තිබූ නමුත් උසස්විම් පරිපාටි අනුමත කර අදාල බඳවා ගැනිම් සිදු කිරිමට 2021 | විශ්‍රාම වැටුප් රහිත සේවක අර්ථසාධක අරමුදල යටතේ මනාපය පල කළ නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටි 12 ක් සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ හා කළමනාකරණ | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරිමට කටයුතු කළයුතු විම. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. තවද, පරිපාලන නිලධාරි, කාර්මික නිලධාරි, විගණන නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම් පරිපාටි අනුමත කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබුණ පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු එම නිලධාරින්ට පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කළ හැකිය. එසේම පරිපාලන නිලධාරි හා කාර්මික නිලධාරි තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සංශෝධනය සිදු කර මේ වන විටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. | |
| (ඉ) 2018 පෙබරවාරි 20 දිනැති අංක 3/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 II හා III අනුව අනුප්‍රාප්තිකයෙකු පත් කිරීමට අපහසු වූද, වැඩ බැලීම වැනි විකල්ප ක්‍රියාමාර්ග මඟින් දැනට සේවාවේ සිටින නිලධාරීන්ගෙන් ඉටුකර ගත නොහැකි වූද, අත්‍යවශ්‍ය තනතුරුවලට පමණක් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශ මත මාස 12 ක උපරිමයට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත හැකිය යන්න දක්වා තිබුණද, අනුප්‍රාප්තිකයෙකු පත්කිරීමට අපහසු තනතුරක් නොවන අධ්‍යක්ෂ පාලන තනතුරට විශ්‍රාමික නිලධාරියෙකු පත්කර මාස 20 ක් ගතවී තිබුණි. එම කාලසීමාවේදි සුදුසු අනුප්‍රාප්තිකයෙකු පුහුණු කිරිමේ කාර්ය, නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් බව දැක්වුණද, චක්‍රලේඛය ප්‍රකාරව එසේ කටයුතු කර නොතිබුණි. | මේ වන විට සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිණියක් පත්කර ඇති බැවින් පාලන අංශයේ කටයුතු පවත්වා ගෙන යැමට දැඩි ගැටළුකාරි තත්වයක් ඇති නොවන බවද සඳහන් කරමි. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරීමට කටයුතු කළයුතු විම |
| (ඊ) 2019 ජුලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව දිවි නැගුම පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජා මුල බැංකු කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත් කිරිම නීතියට පටහැනි බව ගරු නීතිපතිතුමා විසින් දැනුම් දී ඇති බවත් ප්‍රජා මූල බැංකු සමිතිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම පනතේ 44 (ඉ) i හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා ''හැර ඇති බවට සැලකිය යුතු වන අතර , ඉදිරියේදී බැංකු කාර්ය | දැනටමත් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල සේවය කරන විශ්‍රාම වැටුප් සහිත නිලධාරින් ස්ථිර පදනමින් පත්කර තිබීම නීතියට පටහැනි බව ගරු නීතිපතිතුමා විසින් දන්වා ඇත. ඒ අනුව බැංකු කාර්ය මණ්ඩලයට අනුමැතිය ලබාගැනීම සඳහා 2020 ඔක්තෝබර් මස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවන ලෙස අනුයුක්ත කිරීමට කටයුතු කළයුතු විම. |

| | | |
|---|---|---|
| මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනිමටත් ඉන් අනතුරුව පුරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනිම් කිරිමට කටයුතු කළ යුතු බවත් දන්වා තිබුණි. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කර නොතිබු අතර, 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් 31 දක්වා බැංකුවල සිටින 6,444 ක් වූ සමෘද්ධි කාර්යමණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුව විසින් දල වශයෙන් රු. 3,944,366,634 ක වැටුප් ගෙවා තිබුණි. | කර තිබුනද මේ වනතෙක් ඒ සඳහා අනුමැතිය ලබා නොදීම නිසා මෙකී නිලධාරින් තාවකාලිකව මුදාහැරීම ප්‍රමාද වී ඇති බව සඳහන් කරමි. | |
| (උ) 2017 අංක 02 දරන දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 4(ඉ) iii හා iv වගන්තිය යටතේ අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පලකරන ලද නිලධාරීන්ගේ මනාපය සංශෝධනය කිරිමට 2018 අගෝස්තු 30 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2018/6 මඟින් අවස්ථාව ලබා දී තිබු අතර තම මනාපය නැවත ඉදිරිපත් කර පැරණි සේවා කාලය සඳහා ද හිමිකම ලබා ගෙන තිබුණි. චක්‍රලේඛයේ II යටතේ අධිකාරියේ සේවා කාලය වෙනුවෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ නියමයන්ට අනුව මේ වන විට එම නිලධාරින්ගෙන් කොටසක් පාරිතෝෂික මුදල් ලබාගෙන තිබු අතර එම මුදල් රජය වෙත ආපසු ගෙවිම් කල යුතුබව දැක්වුවද, මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | පනතේ 44 (ඉ) III වගන්තිය යටතේ වන නිලධාරින්ගේ වැටුප පිළිබඳ ප්‍රතිපත්තිමය අනුමැතියක් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. ඒ සඳහා ලැබෙන තීරණය අනුව නිලධාරින් තම මනාපය සංශෝධනය කිරීමට බලාපොරොත්තුව සිටින බැවින් එම අයට එම අවස්ථාව ලබාදිය යුතුව ඇත. එසේම මේ වන විටත් විශ්‍රාම යන හා මිය යන නිලධාරින් තම විශ්‍රාම වැටුප සකස් කර ගැනීම වෙනුවෙන් රජයට ගෙවිය යුතු සියළු මුදල් ගෙවා අවසන් කිරීමෙන් පසුව ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාගන්නා බව වැඩිදුරටත් සඳහන් කරමි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු බව. |